සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

GIT | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 12 - 2019

විභාග අංකය ............................ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I කාලය පැය එකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පහත දැක්වෙන පිළිතුරු අතරින් දත්තයක් ලෙස හඳුනාගත හැකි පිළිතුර කුමක්ද?
   i. පුද්ගලයෙකුගේ BMI අගය
   ii. කුරුණෑගල නගරයේ සාමාන්‍ය මාසික උෂ්ණත්වය
   iii. පන්තියක සිටින ශිෂ්‍යයන් ගණිතය විෂය සඳහා ලබා ගත් උපරිම ලකුණ
   iv. පුද්ගලයෙකුගේ උස

02. මධ්‍ය සැකසුම් ඒකකයෙහි ඇති මූලික අංග පමණක් ඇතුලත් වරණය තෝරන්න.
   i. පාලන ඒකකය (CU), අංක ගණිතමය හා තාර්කික ඒකකය (ALU), මතක රෙජිස්තර (memory register)
   ii. පාලන ඒකකය, සසම්භාවී පිවිසුම් මතකය, මතක රෙජිස්තර
   iii. සසම්භාවී පිවිසුම් මතකය, අංක ගණිතමය හා තාර්කික ඒකකය, පාලන ඒකකය
   iv. පාලන ඒකකය, සසම්භාවී පිවිසුම් මතකය,මතක රෙජිස්තර

03. සකසනයට සෘජුවම ප්‍රවේශ විය නොහැකි ආචයන උපාංග ද්විතීයික ආචයන උපාංග වේ. ද්විතීයික ආචයන උපාංග පමණක් ඇතුලත් වරණය වනුයේ,
   i. චුම්භක පටි (magnetic tapes), සංගත තැටි (CD), සසම්භාවී පිවිසුම් මතකය (RAM), මතක කාඩ්පත් (memory cards)
   ii. චුම්භක තැටි, සංගත තැටි, සංඛ්‍යාංක බහුවිධ තැටි, සසම්භාවී පිවිසුම් මතකය
   iii. චුම්භක තැටි, සංගත තැටි, සංඛ්‍යාංක බහුවිධ තැටි, මතක කාඩ්පත්
   iv. සසම්භාවී පිවිසුම් මතකය, සංගත තැටි, සංඛ්‍යාංක බහුවිධ තැටි, මතක කාඩ්පත්

- **පහත දැක්වෙන තොරතුරු උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 04 හා 05 සඳහා පිළිතුරු සපයන්න.**

අමර විසින් පරිගණකයක් මිලදී ගැනීමට අපේක්ෂාවෙන් සිටින අතර ඔහුගේ මිතුරෙකු විසින් අලෙවිය සඳහා ප්‍රදර්ශනය කර ඇති පරිගණකයක් පිළිබඳව පහත තොරතුරු අමර වෙත ලබා දෙන ලදී.

Intel core i3, 2.30 GHz , 4 GB DDR4, 1 TB HDD, Intel UHD Graphics, 15.6 inch Touch screen, windows 10 home, speaker, මූසිකය, යතුරු පුවරුව, වෙබ් කැමරාව.
මෙම පරිගණකය පිළිබඳව අමරට පහත ගැටළු ඇති වූ අතර ඒවා විසඳා ගැනීමට ඔහු ඔබගේ සහය අපේක්ෂා කරයි.

04. මෙම පරිගණකයෙහි සකසනයෙහි වේගය කොපමණද?
   i. 1 TB HDD  ii. Intel core i3  iii. 2.30 GHz  iv. 4 GB DDR4

05. එහි ද්විතීයික මතක ඒකකයෙහි ධාරිතාව කොපමණද?
   i. 15.6  ii. 4 GB DDR4  iii. 1 TB HDD  iv. 2.30 GHz

06. මෙහි සඳහන් වන ආදාන හා ප්‍රතිදාන යන කාර්යයන් ද්විත්වය සඳහා භාවිතා කළ හැකි උපාංගය කවරේද?
i. මූසිකය (mouse) ii. යතුරු පුවරුව (key board)
iii. ස්පර්ශක තිරය (touch screen) iv. වෙබ් කැමරාව (web camera)

07. කමල් ATM යන්ත්‍රය භාවිතා කර තම හරපත ඇතුලත් කොට ගිණුමෙහි පවතින ශේෂය පරීක්ෂා කර බලා අවශ්‍ය මුදලක් හා රිසිට් පත ලබා ගනී. මෙහි ආදානය, සැකසීම හා ප්‍රතිදානය පිළිවෙලින් වන්නේ,
i. හරපත, මුදල හා රිසිට් පත, ගිණුමෙහි ශේෂය පරීක්ෂා කිරීම
ii. හරපත, ගිණුමෙහි ශේෂය පරීක්ෂා කිරීම, මුදල හා රිසිට් පත
iii. ගිණුමෙහි ශේෂය පරීක්ෂා කිරීම, මුදල හා රිසිට් පත, හරපත
iv. මුදල හා රිසිට් පත, හරපත, ගිණුමෙහි ශේෂය පරීක්ෂා කිරීම

- **පරිගණකය සහ එය හා සම්බන්ධ උපාංග ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරනු ලබන වැඩසටහන් මෘදුකාංග ලෙස හැඳින්වේ. මෘදුකාංග සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වෙන අතර ඒවා ආශ්‍රයෙන් 08 සහ 09 ගැටළු සඳහා පිළිතුරු සපයන්න.**

ප්‍රති වෛරස මෘදුකාංග (Anti-virus software), වදන් සැකසුම් මෘදුකාංග (word processing software), Linux, ප්‍රතිභාගීකරණ මෘදුකාංග (defragmentation software), සමර්පණ මෘදුකාංග (presentation software), උපස්ථ මෘදුකාංග (backup software), උපාංග ධාවක මෘදුකාංග (Device drivers), තැටි පිරිසිදු කිරීමේ මෘදුකාංග (Disc cleanup software)

08. ඉහත මෘදුකාංග අතුරින් උපයෝගිතා මෘදුකාංග පමණක් ඇතුලත් නිවැරදි කාණ්ඩය කුමක්ද?
i. ප්‍රති වෛරස මෘදුකාංග, උපස්ථ මෘදුකාංග, ප්‍රතිභාගීකරණය
ii. ප්‍රති වෛරස මෘදුකාංග, පැතුරුම්පත් මෘදුකාංග, උපාංග ධාවක මෘදුකාංග
iii. උපස්ථ මෘදුකාංග, වදන් සැකසුම් මෘදුකාංග, චිත්‍රක සංස්කරණ මෘදුකාංග
iv. උපාංග ධාවක මෘදුකාංග, චිත්‍රක සංස්කරණ මෘදුකාංග, තැටි පිරිසිදු කිරීම

09. ප්‍රකාශනයෙහි සඳහන් වන යෙදුම් මෘදුකාංගක් වනුයේ,
i. Linux ii. සමර්පණ මෘදුකාංග
iii. ප්‍රතිභාගීකරණ මෘදුකාංග iv. තැටි පිරිසිදු කිරීමේ මෘදුකාංග

10. මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව පහත ප්‍රකාශ සලකන්න.
A. පරිගණකයේ සියළුම උපාංග නිසි ලෙස පාලනය කරයි.
B. ලිපිගොනු හා ගොනු බහාලුම් නිර්මාණය කිරීමට ඉඩ සලසයි.
C. පරිශීලකයාට අවශ්‍ය වීඩියෝ ලිපි ගොනු ධාවනය කරයි.

ඉහත වගන්ති අතරින් සත්‍ය ප්‍රකාශ අන්තර්ගත පිළිතුර සඳහන් කරන්න.
i. A පමණි ii. A හා B පමණි iii. B හා C පමණි iv. A,B,C සියල්ල

11. චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක (GUI) මූලික සංරචක නොවන වරණය කුමක්ද?
i. කවුළු (windows) ii. නිරූපක (icon)
iii. ගොනු බහාලුව (folder) iv. මෙනු (menu)

12. අංකිත චිත්‍රක වල මූලිකාංගයන් පමණක් ඇතුලත් පිළිතුර පහත පිළිතුරු අතරින් කවරක්ද?
i. පික්සල් (pixel), විභේදනය (resolution), ධාරිතාවය (capacity), වර්ණය
ii. ප්‍රමාණය, පික්සල්, වර්ණ, විභේදනය
iii. පික්සල්, ධාරිතාවය, වර්ණය, ප්‍රමාණය
iv. ධාරිතාවය, විභේදනය, පික්සල්, ප්‍රමාණය

13. දෘඪ තැටියක්, නම්‍ය තැටියක් හෝ සැනෙලි මතකයක් මෙහෙයුම් පද්ධතියක් මගින් දත්ත තැම්පත් කිරීමට හැකි ආකාරයට පත් කරයි. මෙම ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ ..................................... නමිනි.
i. ආකෘතිකරණය ii. ප්‍රතිභාගිකරණය iii. පංගු බෙදීම iv. උපස්ථ ගොනු තබා ගැනීම

14. අංකිත චිත්‍රකයක වර්ණ ආකෘතීන් දෙකකි. ඒ සම්බන්ධව පහත ප්‍රකාශ සලකා බලන්න.

A. RGB ආකෘතියෙහි රතු, නිල්, කළු වර්ණ පවතී.

B. CMYK ආකෘතියෙහි සියැන්, මැජෙන්ටා, කහ සහ කළු වර්ණ පවතී.

අංකිත චිත්‍රයක වර්ණ ආකෘතීන් පිළිබඳව සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ සඳහන් කරන්න.

i. A පමණක් නිවැරදිය ii. B පමණක් නිවැරදිය

iii. A හා B නිවැරදිය iv. A හා B යන පිළිතුරු දෙකම අසත්‍යය.

15. ශ්‍රව්‍ය ගොනුවකට උදාහරණ වශයෙන් දී ඇති පහත වරණයන්ගෙන් නිවැරදි උදාහරණයක් නොවන්නේ ?

i. WAV ii. MP3 iii. MP4 iv. FLAC

16. වෙක්ටර් චිත්‍රක නිර්මාණය කිරීමට ............................. යන මෘදුකාංගය භාවිතා කරනු ලැබේ.

i. Adobe Photoshop ii. GIMP

iii. Corel draw iv. Page maker

17. පහත දැක්වෙන සංඛ්‍යා පද්ධති අතරින් 0 හා 1 යන සංකේත ද්විත්වය පමණක් අඩංගු සංඛ්‍යා පද්ධතිය කුමක්ද?

i. දශමය (decimal) ii. ද්වීමය(binary)

iii. අෂ්ඨමය (octal) iv. ෂඩ්දශමය (hexa decimal)

18. ද්වීමය සංඛ්‍යාවක් වන $111111_2$ යන ද්විමය සංඛ්‍යාව දශමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කළ විට ලැබෙන අගය ........................... ය.

i. $61_{10}$ ii. $62_{10}$ iii. $63_{10}$ iv. $64_{10}$

19. සංඛ්‍යා පද්ධති පිළිබඳ ගැටලුවක් විසඳු කමල් හට $111_Y$ පිළිතුර ලෙස ලැබිණි. මෙහි Y සඳහා භාවිත කළ හැකි සංඛ්‍යා පද්ධතිය/ පද්ධති වනුයේ,

A - ද්වීමය B - දශමය C - ෂඩ් දශමය

i. A පමණි. ii. B පමණි. iii. C පමණි. iv. A,B හා C සියල්ලම.

20. A හා B නම් වූ ආදාන දෙකක් සහිත බූලියානු AND කාරකය සඳහා අඳින ලද නිවැරදි සත්‍යතා වගුව කුමක්ද?

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 1 |

i

| A | B | X |
|---|---|---|
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |
| 0 | 0 | 0 |

ii

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 1 |
| 1 | 0 | 0 |
| 0 | 1 | 0 |
| 1 | 1 | 1 |

iii

| A | B | X |
|---|---|---|
| 1 | 1 | 0 |
| 1 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 0 | 0 | 1 |

iv

21. පහත දැක්වෙන සත්‍යතා වගුවේ R නම් වූ ප්‍රතිදානයට අදාළ බූලියානු කාරකය වරණ අතරින් තෝරා දක්වන්න.

| P | Q | R |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

i. NOT ii. AND iii. OR iv. NAND

22. පරිගණකය තුළ අනුලක්ෂණ නිරූපණය කිරීම සඳහා විවිධ කේතන ක්‍රම භාවිතා වේ. එවැනි එක් කේතන ක්‍රමයක් වනුයේ?

i. ADA ii. ANSI iii. ANDI iv. ASCII

23. යුනිකේත (unicode) ක්‍රමය සම්බන්ධව දක්වා ඇති පහත ප්‍රකාශ සලකන්න.

A - යුනිකේත පද්ධතිය තුළ එක් අනුලක්ෂණයක් නිරූපනය කිරීම සඳහා බිටු 8ක් භාවිතා වේ.

B - යුනිකේත ක්‍රමය මගින් එකිනෙකට වෙනස් අනුලක්ෂණ 65536 ක් නිරූපණය කළ හැකිය.

C - යුනිකේත ක්‍රමය මගින් සංඛ්‍යාත්මක අගයන් පමණක් නිරූපිතය.

ඉහත ප්‍රකාශ අතුරෙන් අසත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ දක්වන්න.

i. A පමණි    ii. B පමණි    iii. A හා C පමණි    iv. A හා B පමණි

24. විද්‍යුත් තැපැල් තැන්පත් කර තබා ගැනීම හා සේවාලාභී පරිගණක වෙත එම විද්‍යුත් තැපැල් ලබා දීම සිදුවන්නේ,

i. වසම් නාම සේවාදායකය (DNS Server)    ii. වෙබ් සේවාදායකය (Web server)

iii. තැපැල් සේවාදායකය (Mail server)    iv. ගොනු සේවාදායකය (File server)

25. වීඩියෝ සම්මන්ත්‍රණයක් පැවැත්වීම සඳහා ............................... අවශ්‍යය නොවේ.

i. පරිගණකයක්    ii. අන්තර්ජාල සම්බන්ධතාවයක්

iii. email ගිණුමක්    iv. සන්නිවේදන මෘදුකාංග

26. පහත දක්වා ඇත්තේ වළාකුළු පරිගණනය (cloud computing) පිළිබඳ සිසුවකුගේ සටහනකින් උපුටා ගන්නා ලද ප්‍රකාශ කිහිපයකි. මෙම ප්‍රකාශ අතරින් වළාකුළු පරිගණනය භාවිතයේ වාසියක්/වාසි වනුයේ,

A. මෘදුකාංග සඳහා යන වියදම අඩු වීම

B. නඩත්තු ගැටළු අවම වීම

C. කාර්ය සාධනය අඩු වීම

D. නොකඩවා පවතින අන්තර්ජාල පහසුකම් අවශ්‍යය වීම

i. A පමණි    ii. D පමණි    iii. A හා B පමණි    iv. A,B හා C පමණි

27. පහත දැක්වෙන වරණ අතුරින් සත්‍ය වරණය තෝරන්න.

i. අන්තර්ජාලය යනු පරිගණක ජාලවල අතිවිශාල ජාලයකි.

ii. වෙබ් අතරික්සුව මෘදුකාංග යෙදුමක් නොවේ.


iii. අන්තර්ජාලය, ලෝක විසිරි වියමන තුළ පිහිටා ඇති සේවාවකි.

iv. ඒකාකාර සම්පත් නිශ්චායකය (URL), විද්‍යුත් තැපෑල, ගොනු හුවමාරු කිරීම අන්තර්ජාලයේ සේවාවන් කිහිපයකි.

28. විද්‍යුත් තැපැල් ගිණුමක භාවිතා වන ලිපි වර්ගයක් නොවන්නේ,

i. spam    ii. delete/trash    iii. send    iv. drafts

29. http://www.nie.sch.lk/ebook/t12tim.pdf




ඉහත ඒකීය සම්පත් නිශ්චායකයේ නියමාවලිය (protocol), ගොනු බහාළුම (folder) සහ වසම් නාමය (domain name)පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

i. 1, 2, 3    ii. 1, 4, 3    iii. 3, 2, 1    iv. 1, 3, 4

30. පහත සඳහන් පරිගණක ජාල අතුරෙන් වලංගු ජාල ප්‍රරූපයක් නොවනුයේ කුමක්ද?

i. පුද්ගල ප්‍රදේශ ජාල (PAN)    ii. ස්ථානීය ප්‍රදේශ ජාල (LAN)

iii. සමාජීය ප්‍රදේශ ජාල (CAN)    iv. පුළුල් ප්‍රදේශ ජාල (WAN)

31. පරිගණක ජාල දෙකක් සම්බන්ධ කිරීම සඳහා යොදා ගනු ලබන උපකරණය ...................... නම් වේ.

i. ස්විචය (network switch)    ii. ජාලකරණ අතුරු මුහුණත් කාඩ්පත (NIC)

iii. මොඩම් යන්ත්‍රය (modem)    iv. මංහසුරුව (router)

32. පහත සඳහන් මාධ්‍ය අතුරෙන් නියමු මාධ්‍ය පමණක් අන්තර්ගත පිළිතුර සඳහන් කරන්න.
   i. ප්‍රකාශ තන්තු (fiber optic) , ගුවන් විදුලි තරංග (radio waves), සමාක්ෂක යොත් (co-axial cables)
   ii. ගුවන් විදුලි තරංග (radio waves), සමාක්ෂක යොත් (co-axial cables), ක්ෂුද්‍ර තරංග (micro waves)
   iii. සමාක්ෂක යොත් (co-axial cables), ප්‍රකාශ තන්තු (fiber optics), ඇඹරි යුගල (twisted pair)
   iv. ගුවන් විදුලි තරංග (radio waves), ක්ෂුද්‍ර තරංග (micro waves), අධෝරක්ත කිරණ (infrared)

33. පහත A වලින් දැක්වෙන රූපය B රූපයේ ආකාරයට හරවා ගැනීම සඳහා භාවිතා කළ යුතු විධානය කුමක්ද?



A B

   i. Rotate Right $90^0$ ii. Rotate Left $90^0$
   iii. Flip Vertical iv. Flip Horizontal

34. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) මගින් සිදුවන කාර්යය/කාර්යයන් වනුයේ,
   A. පාඨමාලා අන්තර්ගතය ලබා ගැනීම. B. අංකිත පුස්තකාල පහසුකම් ලබා දීම.
   C. පැය 24ම භාවිතා කිරීමට ඉඩ ලබා දීම. D. මාර්ගගත විභාග පැවැත්වීම.

   i. A හා B පමණි ii. C හා D පමණි iii. A, B හා D පමණි iv. ඉහත සියල්ලම

35. මාර්ගගත සාප්පු සවාරිය (online shopping) පිළිබඳව අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
   i. පැය 24 පුරාම මිලදී ගැනීම් කළ හැකි වීම ii. භාණ්ඩය පරීක්ෂාකර මිලදී ගත හැකි වීම.
   iii. වාහන නැවැත්වීමේ පහසුකම් අවශ්‍ය නොවීම iv. ඕනෑම ස්ථානයක සිට මිලදී ගත හැකි වීම

36. පරිගණකය සහ අන්තර්ජාලය සම්බන්ධව ගැටළු සඳහා සහය ලබා ගත හැකි ශ්‍රී ලංකාවේ පවතින ආයතනය කුමක්ද?
   i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිත ආයතනය (ICTA)
   ii. ශ්‍රී ලංකා හදිසි පරිගණක සුදානම් සංසදය (SLCERT)
   iii. ලංකා රාජ්‍ය ජාලය (LGN)
   iv. නැණසල ආයතනය

37. පරිගණක පද්ධතියෙහි දෘඩාංග ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග වනුයේ,
   A. ගිනි පවුර භාවිතය (firewall) B. UPS භාවිතය C. ඵලදායී මුරපද භාවිතය

   i. A පමණි ii. C පමණි iii. A හා B පමණි iv. A,B හා C පමණි

38. e - අපද්‍රව්‍ය බැහැර කිරීමේ 3R සංකල්පයට අයත් නොවන පිළිතුර තෝරන්න.
   i. ප්‍රතිචක්‍රීයකරණය ii. භාවිතයට නොගැනීම
   iii. නැවත භාවිතය iv. භාවිතය අවම කිරීම

39. e - රාජ්‍යයේ කාර්යයක් නොවන්නේ,
   i. හැඳුනුම්පත් නිකුත් කිරීම ii. විවාහ සහතික නිකුත් කිරීම
   iii. උප්පැන්න සහතිකය නිකුත් කිරීම iv. මාර්ගගත සාප්පු සවාරි

40. පරිගණකය දීර්ඝ කාලයක් පුරා භාවිතා කිරීම නිසා වර්තමානයේ මිනිසාට විවිධ ලෙඩ රෝග වලට මුහුණ දීමේ අවදානමක් පවතී. ඉන් එක් රෝගයක් වන කපාල දෝනා සහලක්ෂණය (CTS) ඇති වීමට හේතුව කුමක්ද?
   i. මූසිකය හා යතුරු පුවරුව නිවැරදි ඉරියව්වෙන් භාවිතා නොකිරීම.
   ii. පරිගණක තිරය නිවැරදි ප්‍රමාණයෙන් තබා නොගැනීම.
   iii. කොන්ද කෙලින් තබා උරහිස සැහැල්ලුවෙන් තබා නොගැනීම.
   iv. පරිගණක තිරයෙහි ආලෝකය නිවැරදිව සකස් නොකිරීම.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

GIT | S | II


තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 12 - 2019

විභාග අංකය ............................ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II කාලය පැය දෙකයි

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


01. පරිගණකයේ ගුණාංග පිළිබඳ පහත රූපයෙන් දැක්වේ. පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත රූපය භාවිතා කරන්න.





1) ඉහත රූපයේ දැක්වෙන කවුළුව ලබා ගැනීම සඳහා ඔබ අනුගමනය කරනු ලබන පියවර ලියා දක්වන්න.
2) මෙම පරිගණකයේ මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය කුමක්ද?
3) මෙම පරිගණකයට ස්ථාපනය කර ඇති මෙහෙයුම් පද්ධතිය නම් කරන්න.
4) මෙම පරිගණකයේ ප්‍රධාන මතකයේ ධාරිතාවය කුමක්ද?
5) මෙම කවුළුවෙහි ඡායාරූපයක් ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි පහසුකම නම් කරන්න.
6) මෙම පරිගණකයට ස්ථාපනය කර ඇති සියළුම උපාංගයන් බලා ගැනීමට භාවිතා කරන පහසුකම කුමක්ද?

(ලකුණු 01x6 = 06)

02. රූපය -1 න් දැක්වෙන ලේඛනය සැකසීමට භාවිත කළ වදන් සැකසුම් මෘදුකාංගයක මෙවලම් තීරුවකින් උපුටා ගත් කොටසක් රූපය -2 මගින් දැක්වේ. ඒ අසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




රූපය -1




රූපය -2

i. අංක 1 න් ලේබල් කර ඇති මාතෘකාව හැඩසවීමට භාවිත කළ යුතු මෙවලම හෝ මෙවලම් රූපය -2 න් තෝරා ලියන්න. (ලේබල් කර ඇති අක්ෂරය / අක්ෂර ලිවීම පමණක් ප්‍රමාණවත් වේ.)

ii. අංක 2 න් ලේබල් කර ඇති රූපය පිටුවේ මධ්‍යස්ථ කිරීමට අදාළ මෙවලම හෝ මෙවලම් රූපය -2 න් තෝරා ලියන්න. (ලේබල් කර ඇති අක්ෂරය / අක්ෂර ලිවීම පමණක් ප්‍රමාණවත් වේ.)

iii. අංක 3 න් ලේබල් කර ඇති පාඨ කොටස හැඩසවීමට භාවිත කළ යුතු මෙවලම හෝ මෙවලම් රූපය -2 න් තෝරා ලියන්න. (ලේබල් කර ඇති අක්ෂරය / අක්ෂර ලිවීම පමණක් ප්‍රමාණවත් වේ.)

iv. අංක 4 න් ලේබල් කර ඇති ඡේදය පිටුව තුළ එකෙලි කිරීමට භාවිත කර ඇති මෙවලම හෝ මෙවලම් රූපය -2 න් තෝරා ලියන්න. (ලේබල් කර ඇති අක්ෂරය / අක්ෂර ලිවීම පමණක් ප්‍රමාණවත් වේ.)

v. අංක 5න් ලේබල් කර ලැයිස්තුව හැඩසවීමට යොදාගත් මෙවලම හෝ මෙවලම් රූපය -2 න් තෝරා ලියන්න. (ලේබල් කර ඇති අක්ෂරය / අක්ෂර ලිවීම පමණක් ප්‍රමාණවත් වේ.) (ලකුණු 01x5 = 05)

vi. මෙම ගොනුවෙහිම පිටපතක් D තැටියෙහි letter නම් ගොනු බහලුම තුළ summer යන නමින් තැම්පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ලියා දක්වන්න. (ලකුණු 02)

vii. වදන් සැකසුම් මෘදුකාංග සඳහා උදාහරණ දෙකක් දෙන්න. (ලකුණු 02)


viii. ඉහත ගොනුව "Olympic" නමින් වදන් සැකසුම් ගොනුවක් ලෙසම සුරැකිය යුතු නම් එම ගොනුවේ ගොනු නාමය සඳහා තිබිය හැකි ගොනු දිගු දෙකක් දක්වන්න. (ලකුණු 02)

ix. වදන් සැකසුම් ගොනුවක් "pdf"ලෙස සුරැකීමෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද? (ලකුණු 01)

03. ගැමුණු පාසලේ පරිගණක විද්‍යාගාරය සඳහා මිලට ගත් භාණ්ඩ සඳහා බිල්පත පහත පැතුරුම්පත් කොටසින් දැක්වේ.

| | A | B | C | D | E | |
|---|---|---|---|---|---|---|
| 1 | **ABC computers** | | | | | |
| 2 | ***Item No*** | ***Item*** | ***Unit Price*** | ***Quantity*** | ***Value*** | A |
| 3 | A001 | Mouse | Rs.690.00 | 5 | Rs.3,450.00 | |
| 4 | A002 | Key Board | Rs.725.00 | 4 | Rs.2,900.00 | |
| 5 | A016 | 8GB pen drive | Rs.1,699.00 | 5 | Rs.8,495.00 | |
| 6 | A007 | 14" monitor | Rs.8,990.00 | 2 | Rs.17,980.00 | |
| 7 | A020 | Speaker set | Rs.1,250.00 | 4 | Rs.5,000.00 | |
| 8 | **Total** | | | | Rs.37,825.00 | |
| 9 | | | | | | |

පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත රූපය භාවිතා කරන්න.




1. පහත සඳහන් හැඩගැස්වීම් සඳහා යොදාගෙන ඇති පහසුකම් මොනවාද? අංකය පමණක් ලියා දක්වන්න.
   a) A ලෙස පෙන්වා ඇති මාතෘකා පේළිය හැඩසවි ගැන්වීම
   b) ***Value*** තීරුවේ ඇති මුදල්මය වටිනාකම පෙන්වීම
   c) වගුවේ බෝඩරය සකස් කිරීම
   d) **ABC Computers** මාතෘකාව ඇක්වෙන පේළිය එක් කෝෂයක් සේ සංයුක්ත කිරීම.

(ලකුණු 0.5x4 = 02)

2. මිලට ගත් මූසික (Mouse) වල වටිනාකමෙහි ගණනය කිරීම සඳහා අවශ්‍ය නිවැරදි සූත්‍රය ලියා දක්වන්න. (ලකුණු 02)
3. E3 කෝෂයේ ඇති සූත්‍රය E4 සිට E7 දක්වා කෝෂවලට පිටපත් කිරීමට අදාල පියවර ලියා දක්වන්න. (ලකුණු 02)

4. බිලෙහි මුළු වටිනාකම ගණනය කිරීම සඳහා E8 කෝෂයට ඇතුලත් කළයුතු තනි ශ්‍රිතය ලියා දක්වන්න (ලකුණු 02)

5. C තීරුවට අදාල මිල වැඩිම අයිතමය සොයා ගැනීම සඳහා අවශ්‍ය සූත්‍රය ලියා දක්වන්න. (ලකුණු 02)

6. මෙහිදී මූසික (Mouse) 4ක් මිලට ගත් අතර ඉහත පැතුරුම්පතේ එය වැරදීමකින් 5 ක් ලෙස D3 කෝෂයේ සටහන්ව ඇත. එය නිවැරදි ලෙස සටහන් කලේනම් කුමන කෝෂයන් නිතැතින් යාවත්කාලීනවන්නේද? (ලකුණු 02)

04 සීතා බේකර්ස් යනු පාසල් ආපනශාලා සඳහා කෙටිකෑම සපයන ප්‍රසිද්ධ ව්‍යාපාරයකි. එය පාසල් කිහිපයකට සැපයුම් කරනු ලබන අතර දිනපතා එම අපනශාලාවල විකුණුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුන් විසින් දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලැබේ.

**අයිතම වගුව**

| Item_No | Item | Price |
|---|---|---|
| S100 | Egg Bun | 25 |
| S101 | Egg Role | 35 |

**පාසල් වගුව**


| Sch_ID | Sch_Name |
|---|---|
| M01 | Weeraketiya N.S |
| M02 | Thissa M.V |

**විකුණුම් වගුව**

| Date | Item_No | Sch_ID | Recieved | Sales |
|---|---|---|---|---|
| 2019.05.18 | S100 | M02 | 150 | 139 |
| 2019.05.18 | S101 | M01 | 200 | 200 |
| 2019.05.19 | S101 | M02 | 120 | 110 |
| 2019.05.19 | S100 | M01 | 220 | 210 |

1. ප්‍රාථමික (Primary) යතුරක් එයට අදාල වගුවේ නම සමග ලියා දක්වන්න.
2. ආගන්තුක (Foreign) යතුරක් එයට අදාල වගුවේ නම සමග ලියා දක්වන්න.
3. පාසල් ආපනශාලා වල දුරකථන අංක දත්ත සමුදායට ඇතුලත් කල යුතුව ඇත. එය ඇතුලත් කිරීම සඳහා සුදුසු වගුව/වගු කුමක්ද?
4. ආයතනය විසින් 2019.05. 22වන දින Katuwana M.V. පාසලේ නව ශාඛාවක් ආරම්භ කරන ලදී
   (a) මෙහිදී කුමන වගුව/ වගු යාවත්කාලීන කළයුතු වන්නේද?
   (b) යාවත්කාලීන කිරීම් සඳහා අදාල වගුවල යාවත්කාලීන කළ පේළි, ඒවාට අදාල වගු නාම සමගින් ලියා දක්වන්න.
5. දත්ත ඇතුලත් කිරීම සඳහා සහ වගුවලින් දත්ත දර්ශනය කර ගැනීම සඳහා භාවිතා වන දත්ත සමුදාය මෘදුකාංග වල ඇති පහසුකම කුමක්ද? (ලකුණු 01x6 = 06)

05. පරිසර දිනය නිමිත්තෙන් "පරිසර දූෂණය" යන මාතෘකාව යටතේ විද්‍යුත් සමර්පනයක් නිර්මාණය කිරීමට සජානි වන ඔබේ මිතුරියට ලැබී ඇත. ඇය මේ සඳහා කදා හතරකින් යුත් සමර්පනයක් පහත රූපයේ පරිදි සකස් කර ඇත.





එහිදී පහත සඳහන් කරුණු මෙම සමර්පනයට ඇතුළත් කිරීමට ඇය ඔබෙන් උපකාර ඉල්ලා සිටියි.

1. කදා 2 හා 3 අතරට නව කදාවක් එක් කිරීමට අදාල පියවර ලියා දක්වන්න.
2. නව කදාවට පරිසර දූෂණය පිළිබඳව කෙටි වීඩියෝ පටයක් වන polution.Avi වීඩියෝ පටය ඇතුළත් කරන්නේ කෙසේද?
3. පරිසර දූෂණය පිලිබඳ වැඩිදුර තොරතුරු අධ්‍යනය සඳහා ඉහත දැක්වෙන 4 වන කදාවට අන්තර්ජාල සබැඳියක් ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි මෙවලම කුමක්ද?
4. සමර්පණ මෘදුකාංගය තුළ පහත සඳහන් එක් එක් කාර්යයන් සඳහා භාවිතා කරන කෙටි මං යතුරු ලියා දක්වන්න.
   i. සමර්පණ කදා දැක්ම (slide show) දසුනට ගෙන යාම.
   ii. ඉදිරිපත් කිරීම සිදු කරන අතරතුර තිරය සුදු පැහැ ගැන්වීම.
5. සමර්පණ නිර්මාණය සඳහා භාවිතා කළ හැකි මෘදුකාංග දෙකක් නම් කරන්න. (ලකුණු 01x6 = 06)

06. නිම්සිරි මහතා ABC සමාගමේ තොග මිලදී ගැනීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන අතර ඔහුගේ විද්‍යුත් තැපැල් ලිපිනය nimsiri@abc.com වේ. ඔහු විසින් තම ආයතනයේ කළමනාකරු වන චන්ද්‍රසිරි මහතාටද (chandrasiri@abc.com) පිටපතක් යවමින් XYZ සමාගමේ අලෙවි නිලධාරියා වන අරුණසිරි මහතා වෙත (arunasiri@xyz.com) "please see the attachment" යන පණිවිඩය අඩංගු විද්‍යත් තැපැල් පණිවිඩයක් යවයි.

මෙය "sales machine" යන ශීර්ෂය යටතේ තම ආයතනයේ කාර්මික නිලධාරියා වන කමලසිරි මහතා (kamalsiri@abc.com) වෙත අනෙක් පුද්ගලයන්ට නොපෙනෙන සේ විද්‍යුත් තැපැල් පණිවිඩයක පිටපතක් යැවිය යුතු අතර "machine details" යන නමින් පවතින ලිපි ගොනුවද යැවිය යුතුය.


ඉහත අවශ්‍යතා සපිරෙන පරිදි 1 සිට 6 දක්වා හිස්තැන් සඳහා වඩාත් සුදුසු විද්‍යුත් තැපැල් ලිපින හෝ මාතෘකා ලියන්න.




(ලකුණු 01x6 = 06)

07. පහත දැක්වෙන වෙබ් පිටුව නිර්මාණය කිරීම සඳහා මෙහි දැක්වෙන ප්‍රභව කේතය භාවිත කරනු ලැබුවේයැයි සැලකිල්ලට ගෙන එහි හිස්ව ඇති පද පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

(H2, Center, Tr , Title , Li , Head, H1, Td , Img , A , Table , Th, Font , Ul , ol , Audio Src, Video Src )




```
<Html>
<Head>
< 1 >
 Linux
</ 1 >
</Head>
<Body>
< 2 >< 3 > LINUX </ 3 ></ 2 >
<p>Linux is a family of free an open source software
operating systems based on the linux kernal.< 4 >
an operating system kernel first released on September 17, 1991 by Linus Torvalds. < 4 >
Linux is typically packaged in a Linux distribution . </p>
< 2 > < 5 src="tux.jpg" height="200" > </ 2 >
< 6 > Linux Distributions </ 6 >
< 7 type = "circle">
        < 8 > Red Hat </ 8 >
        < 8 > Ubuntu </ 8 >
        < 8 > Debian </ 8 >
</ 7 >
< 9  Border= "1">
< 10 >< 11 >Developer </ 11 >< 11 >Community (Linus torvalds)</ 11 ></ 10 >
< 10 >< 11 >Written In </ 11 >< 11 >C and Other</ 11 ></ 10 >
< 10 >< 11 >Os Family</ 11 >< 11 > Unix - like </ 11 ></ 10 >
</ 9 >
<p> source - < 12 href="https://en.wikipedia.org/wiki/Linux"> wikipedia </ 12 ></p>
</body>
</Html>
```

(ලකුණු 01x12 = 12)

**තෙවන වාර පරීක්ෂණය - 2019**

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණය -12 ශ්‍රේණිය**

**1** පත්‍රය පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 01 | iv | 11 | iii | 21 | iii | 31 | iv |
| 02 | i | 12 | ii | 22 | iv | 32 | iii |
| 03 | iii | 13 | i | 23 | iii | 33 | iii |
| 04 | iii | 14 | ii | 24 | iii | 34 | iv |
| 05 | iii | 15 | iii | 25 | iii | 35 | ii |
| 06 | iii | 16 | iii | 26 | iii | 36 | ii |
| 07 | ii | 17 | ii | 27 | i | 37 | iii |
| 08 | i | 18 | iii | 28 | iii | 38 | ii |
| 09 | ii | 19 | iv | 29 | ii | 39 | iv |
| 10 | ii | 20 | i | 30 | iii | 40 | i |

(මුළු ලකුණු 01x40= 40)

**II කොටස - රචනා ප්‍රශ්න**

| ප්‍රශ්න අංකය | අනු අංක | | ලකුණු |
|---|---|---|---|
| 01 | i | This PC/ පරිගණක සලකුණ තෝරා ගැනීම - මූසිකයහි වම් බොත්තම Click කිරිම - properties තෝරා ගැනීම හෝ සුදුසු වෙනත් ක්‍රමයක් | 01 |
| | ii | 1.5 GHz | 01 |
| | iii | Windows 7 | 01 |
| | iv | 2GB | 01 |
| | v | Snipping tool / Print Screen button | 01 |
| | vi | Device manager | 01 |
| | | ප්‍රශ්නය සඳහා මුළු ලකුණු | 06 |
| 02 | i | G | 01 |
| | ii | K | 01 |
| | iii | B | 01 |
| | iv | M | 01 |
| | v | I | 01 |
| | vi | file→ save as→ select D→ select letter folder→ file name | 02 |
| | vii | libre office writer, open office writer | 02 |
| | viii | doc , docx , odt | 02 |
| | ix | ඕනෑම පරිගණකයක් හරහා විවෘත කිරීමේදී එහි අක්ෂර සහ හැඩසව් වලට වෙනසක් සිදු නොවීම | 01 |
| | | ප්‍රශ්නය සඳහා මුළු ලකුණු | 12 |
| 03 | i (a) | 8 හා 1 | 0.5 x 4 = 02 |
| | i (b) | 12 | |
| | i (c) | 3 | |
| | i (d) | 11 | |
| | ii | = C 3 * D 3 | 02 |

| | | | |
|---|---|---|---|
| | iii | 1 ක්‍රමය ;- E 3 කෝෂය පහළ දකුණු කෙළවරෙහි පිරවුම් හැඩලය click කර ගනිමින් E 7 දක්වා ඇදගෙන යාම. හෝ<br>2 ක්‍රමය ;- E3 කෝෂය තෝරා ගැනීම ⟶ E3 කොපි කිරීම - E4 සිට E7 දක්වා select කිරීම - paste කිරීම | 02 |
| | iv | = sum (E3 : E7) | 02 |
| | v | = max (C3 : C7) | 02 |
| | vi | E3 හා E8 | 02 |
| | | ප්‍රශ්නය සඳහා මුළු ලකුණු | 12 |
| 04 | i | අයිතම වගුව - Item_No / පාසල වගුව - Sch_ID | 01 |
| | ii | විකුණුම් වගුව - Sch_ID / විකුණුම් වගුව - Item_No | 01 |
| | iii | පාසල වගුව | 01 |
| | iv | (a)පාසල වගුව (b) M03 – Katuwana M. V. | 02 |
| | v | FORM (පෝරම) | 01 |
| | | ප්‍රශ්නය සඳහා මුළු ලකුණු | 06 |
| 05 | i | කදා අංක 02 තෝරා Enter press කිරීම / කදා අංක 02 තෝරා Home හි New slide තේරීම / කදා අංක 02 තෝරා Ctrl + m press කිරීම | 01 |
| | ii | insert හි video click කිරීම - polution.avi තෝරා insert කිරීම | 01 |
| | iii | hyperlink | 01 |
| | iv | (a) F5 (b) shift + W | 02 |
| | v | MS power point, open office impress, libre office impress etc. | 01 |
| | | ප්‍රශ්නය සඳහා මුළු ලකුණු | 06 |
| 06 | I | arunasiri@xyz.com | 01 |
| | Ii | Chandrasiri@abc.com | 01 |
| | Iii | kamalsiri@abc.com | 01 |
| | Iv | Sales machine | 01 |
| | V | Please see the attachment | 01 |
| | Vi | Machine details | 01 |
| | | ප්‍රශ්නය සඳහා මුළු ලකුණු | 06 |
| 07 | 1 | Title | 01 |
| | 2 | Center | 01 |
| | 3 | H1 | 01 |
| | 4 | Br | 01 |
| | 5 | Img | 01 |
| | 6 | H2 | 01 |
| | 7 | ul | 01 |
| | 8 | Li | 01 |
| | 9 | Table | 01 |
| | 10 | Tr | 01 |
| | 11 | Td | 01 |
| | 12 | A | 01 |
| | | මුළු ලකුණු | 60 |